# සමුපකාරය හා සත්ත්ව පාලන කටයුතු

*වැලිසර – රාගම, ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ කථිකාචාරිනී*
*එස්. ගජනායක විසිනි.*
*බී. එස්සී (කෘෂිකර්ම), එම්. එස්සී (කෘෂිකර්ම)*

සමුපකාර කටයුතු ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටකට අළුත් අත්දැකීමක් නොවේ. සමුපකාරය යනු 'එකා සැමටත් සැම එකාටත්' යන කාර්යය සංසිද්ධිය තුළ පිහිටි වැදගත් සංකල්පයකි. එහි ක්‍රියා කාරිත්ත්වය තුළින් දිස්වන්නේ සාමූහික ප්‍රයත්නයක් එකිනෙකාගේ පෞද්ගලික හා පොදු පරිශ්‍රමය තුළින් සාර්ථකත්වයට පත් කර ගැනීමට දරණ උත්සාහයකි. එබැවින් පුද්ගලයන් කිහිප දෙනෙක් හෝ සමූහයක් එකට එක්වී පොදු අරමුණක් හෝ අරමුණු රාශියක් ඉටු කර ගැනීම සඳහා සමුපකාර ක්‍රමය භාවිතා කර ගෙන යනු ලැබේ.

මෙම ක්‍රමය වියදම් අධික වූ සත්ත්ව පාලන කටයුතු හා සම්බන්ධව යොද ගැනීමට ද පුළුවන. එවිට අඩු වියදම් සහිතව කරගෙන යා හැක. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වැසියෙකු ගේ ආර්ථිකයේ ස්වභාවය හා සසඳන විට වැඩි නිමැවුමක් ලබා දෙන කුකුළු පැටවුන්, උසස් ආරයේ ගවයින්, එළුවන් හා ඌරන් වැනි සතුන් හා සත්ත්ව පාලන යෙදවුම් ලබා ගැනීමද සත්ත්වාහාර ද අධික ප්‍රාග්ධන වියදමක් දැරීමට සිදුවන ආයෝජනයන් වේ. එබැවින්, සුළු පරිමාණ සත්ත්ව නිෂ්පාදන ඒකක පවත්වා ගෙන යන ගොවීන්. පවා ඒවා පවත්වාගෙන යාම දුෂ්කරතා මැද කරගෙන යන අතරතුරදීම අලෙවිකරණය ද තවත් ප්‍රශ්ණයක් බවට පත් වනුයේ අතරමැදි වෙළඳුන්ගේ හා කළුකඩකාරයින්ගේ ග්‍රහණයට අසුවන අවස්ථාවල දී ය. බොහෝ අත්දැකීම් සළකා බලන විට බොහොමයක් දෙනා සත්ත්ව පාලන කටයුතුවලට නැඹුරු වන්නේ හා පිවිසෙන්නේ එම නිෂ්පාදනවල වෙළඳ පොල මිළ අධික අවස්ථාවන්හි දී ය. එහෙත් සත්ත්ව පාලන ඒකකයකින් එහි නිම් ද්‍රව්‍ය වෙළඳපොලට නිකුත් කිරීමට සෑහෙන කාලයක් ගත වේ. එම අවස්ථාව වන විට වෙළඳ පොල මිළ වෙනස් වී තිබිය හැකිය. විශේෂයෙන් මිළ ස්ථායීකරණ වැඩ පිළිවෙලක් නොමැති නම් මේ ආකාරයේ භාණ්ඩ නිපදවන, සුළු පරිමාණ නිෂ්පාදකයා, මෙවැනි දුෂ්කරතා වලදී අධෛර්යයට පත් වේ.

මේ හා සම්බන්ධ කාරක ප්‍රාග්ධන දුෂ්කරතා මතුවන අවස්ථාවලදී ඔවුන් බැංකුවක් වැනි පිළිගත් ආයතනයකින් ණය පහසුකම් ලබා ගන්නට ගිය ද සුළු පරිමාණ නිෂ්පාදකයන් වශයෙන් බැංකුවට දීමට තිබෙන "මූල්‍යමය හැඳින්වීම" ප්‍රමාණවත් නොවන්නට ද පුළුවන. ඇපකරුවන් සෙවීමේ දී ද අමාරුකම්වලට මුහුණ පෑමට සිදු වේ. එම ප්‍රශ්ණයේ යථා ස්වරූපය මෙසේ වන බැවින්, සෑම විටම ධනවත් මහා පරිමාණ ගොවියෙකුට වඩා සුළු පරිමාණ ගොවියෙකුට යම්කිසි විධිමත් සැළැස්මකට සත්ත්ව නිෂ්පාදන කටයුතු වල නියැලී, සත්ත්ව නිෂ්පාදන කටයුතු ලාභදායී ලෙස පවත්වාගෙන යාමට තිබෙන අවස්ථාව බොහෝ දුරට අඩු වේ.

එබැවින් යම්කිසි ප්‍රදේශයක සිටින සත්ත්ව පාලනයේ නිරත වන මෙන්ම සත්ත්ව පාලනයට කැමති සුළු පරිමාණ ගොවීන් ඒකරාශී වී සමුපකාර සංවිධානයක් පිහිටුවා ගැනීමෙන්, ධනවත් මහා පරිමාණ ගොවීන් මෙන්ම හෝ නැත්නම්, ධනවත් ගොවීන් අභිබවා හෝ, තම සත්ත්ව නිෂ්පාදනවලින් ලාභ ලබා ගැනීමට අවස්ථාව උදාකර ගත හැක. මෙම ක්‍රියාවේ දී "තනි සුළු පරිමාණ ගොවියෙකු" හා එමෙන්ම ගොවීන් ඒකරාශී වී බිහි කර ගන්නා "සමුපකාර සංවිධානයක්" යන්නත් සැබෑ වශයෙන්ම සසඳන විට පොල් කෙන්දක් හා පොල් කෙඳි රාශියක් එකතු වී සාද ගන්නා කඹයකුත් යන ද්වි ස්වරූපයෙන් උද වන "ශක්තියේ" වෙනස සිහියට නැගිය හැක. මෙහි දී සුළු පරිමාණ ගොවියෙකු තනි පුද්ගලයෙක් වශයෙන් තම සත්ත්ව පාලන කටයුතුවල දී —

(i) යෙදවුම් ලබා ගැනීමේ දී,

(ii) ඒවා ප්‍රවාහණය කර ගැනීමේ දී,

(iii) තමන්ට අවශ්‍ය ණය පහසුකම් පිළිගත් ආයතනවලින් ලබා ගැනීමේ දී,

(iv) තමන්ට අවශ්‍ය ශිල්පීය තාක්‍ෂණය ලබා ගැනීමේ දී,

(v) විවිධ දුෂ්කරතා මධ්‍යයේ නිෂ්පාදනය කරගත් නිමැවුම අලෙවි කර ගැනීමේ දී

යන විවිධ අවස්ථාවන් හිදී, මුහුණ දීමට සිදුවන දුෂ්කරතා සළකා බලන විට සමුපකාර සංවිධානයකට සම්බන්ධවීමේ වටිනාකම මනාව පැහැදිළි වේ. එවැනි සංවිධානයක් තුළින් සුළු පරිමාණ ගොවියෙකුට එම අවශ්‍යතා සපුරා ගැනීමේ දී යටකී තරම් ප්‍රබල ප්‍රශ්ණ වලට මුහුණ දීමට සිදු නොවේ. සමුපකාර සංවිධානයක සාමාජිකත්ත්වය දරණ ගොවියෙකු සාමාන්‍ය ජීවිත ගොවියෙකු මෙන් නොව, පිළිගත් සංවිධානයක නියෝජිතයකු වශයෙන් පිළිගන්නා බැවින් ඒ හා සම්බන්ධ කාර්යයන් බොහොමයක් පහසුවෙන් ඉටු කර ගැනීමට ඔහුට අවස්ථාව උදවේ.

සුළු පරිමාණ ගොවීන් සමුපකාර සංවිධානයක සාමාජිකයින් වූ විට ඔවුන් සියලු දෙනාටම අවශ්‍ය යෙදවුම් එකවර මිළදී ගෙන සංවිධානාත්මකව ප්‍රවාහනය කර ගත හැක. ශක්තිමත් සංවිධානයකට පුද්ගලිකව ගොවියෙකුට දැරීමට සිදු වන ආකාරයේ ප්‍රායෝගික අපහසුතා ඇති නොවේ. ණය පහසුකම් ලබා ගැනීමේ දී බැංකු වැනි ආයතන මගින් සමුපකාර සාමාජිකයෙකු පුද්ගලික ගොවියෙකුට වඩා වැඩි සැළකිල්ලකින් පිළිගනී. තව ද, විශේෂයෙන්ම සත්ත්ව නිෂ්පාදන අලෙවි කටයුතුවලදී සාමාජිකයින්ගේ සත්ත්ව නිෂ්පාදන අලෙවිය සමුපකාර සංවිධානය තුළින් පහසුවෙන්ම ඉටු කර ගත හැක. සත්ත්ව පාලනමය නිම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට යම්කිසි කාලයක් ගත වුවත් සමුපකාර සාමාජිකයින් සියළුදෙනාම හෝ එම නිෂ්පාදන කටයුතුවල නියැලෙන සාමාජිකයින් හෝ යම්කිසි සැලැස්මකට නිෂ්පාදන කටයුතුවල නියැලීමෙන් නොකඩවා අවුරුද්ද පුරාම සත්ත්ව නිෂ්පාදන වෙළඳ පොළට සැපයිය හැකි ආකාරයට නිෂ්පාදන අලෙවි කටයුතු සංවිධානාත්මකව කරගෙන යාමට අවස්ථාව ලැබේ. එමෙන්ම සමහර අවස්ථාවලදී, සුළු පරිමාණ ගොවියෙකුට තනිවම ඉටු කළ නොහැකි තම නිෂ්පාදන වෙළඳ පොළට සකස් කිරීම වැනි කාර්යයන් ද සමුපකාර සංවිධානය තුළින් ඊට වඩා කාර්යක්‍ෂමව ඉටු කළ හැකිය. සාමාජිකයින්ගේ සහයෝගය තුළින් හෝ, සමුපකාර සංවිධානය මගින් ලබා දිය හැකි තාක්‍ෂණික දැනුම තුළින් හෝ, එය පහසුවෙන් ඉටු කළ හැකිය. තවද ඉක්මණින් නරක් වන සත්ත්ව නිෂ්පාදන සඳහා සුළු ගොවියෙකුට ශීතකරණ හා

ගබඩා පහසුකම් ආදිය සපයා ගත නොහැකි වුවද, සමුපකාරය වැනි සංවිධානයක් තුලින් එම පහසුකම් සපයා ගැනීම අමාරු කාර්යයක් නොවේ.

කෙසේ වෙතත් සමුපකාර සංවිධානයක් ඉතා සාර්ථක අන්දමින් පවත්වා ගෙනයාම සඳහා –

(1) සමුපකාර සාමාජිකයින් තම සාමාජිකත්වය ස්ව කැමැත්තෙන්ම ලබාගත යුතුයි. එනම්, සමුප කාරයක අවශ්‍යතාවය තම සිතට දැනී, ඒ අනුව සංවිධානය වීම හෝ සාමාජිකයෙකු වීම, තම කැමැත්තෙන්ම එනම්, බාහිර බලපෑමකින් තොරව සිදු විය යුතුයි.

(2) සමුපකාර සංවිධානයේ තීරණ ගැනීම ප්‍රජාතන්ත්‍රවාදීව සිදු විය යුතුයි. එනම්, කාරක 'සභාව ක්‍රියාත්මක විය යුත්තේ වැඩි දෙනා ගේ කැමැත්ත අනුව තීරණ ගැනීමෙනි.

(3) සමුපකාරය බිහි කිරීමට ලබා ගත් කොටස් මුදල් වලට ගෙවිය යුතු ලාභාංශ ප්‍රමාණය අවමව පවත්වා ගත යුතුයි. නැතහොත් සමුපකාර ලාභාංශ බෙදීමේදී කොටස්කරුවන් වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීමට සිදු වුවහොත් සක්‍රීය සාමාජිකයින්ගේ වෙළඳ කටයුතු සඳහා ගෙවීමට තිබෙන ලාභාංශ ප්‍රමාණය අඩු වී ඔවුන් දිරිමත් වීම අඩු වේ.

(4) සියළුම සාමාජිකයින් සඳහා ම, එකම ආකාරයට අනුග්‍රහය දැක්විය යුතුවේ. එසේ නැතිව ධනවත් බව, උගත්කම, කුලමානය වැනි දේ සැළකිල්ලට ගතහොත් සාමාජිකයින් අතරේ භේද ඇති වී සංවිධානය අඩපන විය හැකිය.

(5) සමුපකාර සංවිධානය තුළින් සාමාජිකයින්ගේ අධ්‍යාපනික පසුබිම වැඩි දියුණු කළ යුතු වේ. පුද්ගලිකව සුළු පරිමාණ ගොවි යෙකුට ලබා ගත නොහැකි අධ්‍යාපනික පහසුකම් ආදිය සමුපකාර සංවිධානය තුළින් ලබා දිය හැකිය.

(6) තම සමුපකාර සංවිධානය අනෙකුත් සමුපකාර ආයතන සමගද ප්‍රදේශයේ වෙනත් ආයතන සමඟ ද සුහදව කටයුතු කළයුතු වේ. වෙනත් සංවිධානවලින් තම අවශ්‍යතාවයන්ට උදව් උපකාර ලබා ගන්නා සේම තම සමුපකාර සංවිධාන මගින් ද අනෙකුත් ආයතනවලට උදව් උපකාර කළයුතු වේ.

සමුපකාර සමිතියක් කාර්යක්‍ෂමව පවත්වා ගෙන යෑම සඳහා කාරක සභාව ඉතාමත් ප්‍රගතිශීලී අන්දමින් කටයුතු කළයුතු වේ. කාරක සභාව විසින් නොකඩවා කෙටි කාලීනව රැස්වී, උද්ගත වන ප්‍රශ්නවලට, කාලෝචිත තීරණ ගත යුතුවේ. එසේම, සාමාජිකයින් ගේ නිෂ්පාදන කටයුතු කෙරෙන අන්දම ආදිය සොයා බලා අඩුපාඩු සකස් කර දිය යුතු වේ. සක්‍රීය සාමාජිකයින් දිරි ගැන්වෙන අන්දමට කටයුතු කළ යුතුවේ. සාමාජිකයින්ගේ සත්ත්ව නිෂ්පාදන ප්‍රශ්න මෙන්ම පෞද්ගලික ප්‍රශ්නවලටද සංවිධානය තුළින් සැපයිය හැකි උදව් උපකාර ආදිය සළසා දිය යුතුවේ. සාමාජිකයින් අතර නිතරම අන්‍යෝන්‍ය සුහද බව වැඩි වන අන්දමින් ක්‍රියා කළ යුතු වේ. සෑම සාමාජිකයෙකුම සංවිධානයේ වැදගත් අත්‍යාවශ්‍ය පුද්ගලයෙකු ලෙස හැඟෙන පරිදි කටයුතු කළ යුතුවේ. සමුපකාර සංවිධානය, සාමාජිකයින් නිසා කාර්යක්ෂමව පවත්වාගෙන යන බවත්, සත්ත්ව පාලන සාමාජිකයින්, සමුපකාර සංවිධානය නිසා එම අරමුණුවලට අනුව ආරක්ෂා වන බවත්, අන්‍යෝන්‍ය වශයෙන් තහවුරු වන අන්දමට කටයුතු කළ යුතු වේ.

'සියළුම සත්ත්ව පාලන සමුපාකාර සංවිධානවල සේවය ඒවායේ සාමාජිකයින්ට නොමසුරුව ලැබීමෙන් රටේ සත්ත්ව නිෂ්පාදනය වැඩි දියුණු වීම සිදුවන අතර එය රටේ සංවර්ධනයත්, සත්ත්ව නිෂ්පාදකයින්ගේ දියුණුව හා සුබසිද්ධියත් තහවුරු කර දෙයි.